බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
පුරප්පාඩු
(කොන්ත්‍රාත් පදනම මත)

නොවැළැක්විය හැකි හේතූන් මත, පුවත්පත් දැන්වීම මඟින් ප්‍රකාශයට පත් කර තිබූ පහත සඳහන් තනතුරු සඳහා අයදුම්පත් කැඳවීම තාවකාලිකව අත්හිටුවීමට තීරණය කර ඇති බව කරුණාවෙන් සලකන්න.

- **සහකාර සාමාන්‍යාධිකාරී – පාලන හා මානව සම්පත් (MM 1-1)**
- **සහකාර සාමාන්‍යාධිකාරී – අලෙවි,නිෂ්පාදන හා පර්යේෂණ (MM 1-1)**
- **සැපයුම් හා වෙළඳාම් නිලධාරී (JM 1-1)**
- **කාර්යාල කාර්ය සහායක (PL 1)**

මෙම තීරණය හේතුවෙන් ඇතිවිය හැකි අපහසුතා පිළිබඳ කණගාටුව පළ කරන අතර, මෙම තනතුරු සම්බන්ධයෙන් ඉදිරියේදී ගන්නා ක්‍රියාමාර්ග පිළිබඳ ව නියමිත අවස්ථාවේදී දැනුම් දීමට කටයුතු කරනු ඇත.

පුවත්පත් දැන්වීමෙහි ප්‍රකාශයට පත් කර ඇති සෙසු තනතුරු සඳහා අදාළ සුදුසුකම්, පළපුරුද්ද හා අනෙකුත් අවශ්‍යතා පහත පරිදි වේ.

තනතුර - **අභ්‍යන්තර විගණක (MM 1-1)**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබා ලබා ගත් කළමනාකරණය/ගණකාධිකරණය/වාණිජ්‍යය පිළිබඳ උපාධිය සමඟ රජයේ දෙපාර්තමේන්තුවක/සංස්ථාවක/මණ්ඩලයක හෝ පිළිගත් ආයතනයක විගණනය පිළිබඳව වසර තුනක (03) පළපුරුද්ද.

දීමනාව :- කළමනාකරණ සේවා චක්‍ර ලේඛ අංක 01/2025 **MM 1-1**

- රු. 81,710/=
- චක්‍ර ලේඛණ ප්‍රකාරව කොන්ත්‍රාත් තනතුරට අදාළ අනෙකුත් දීමනා

වයස් සීමාව : – අවු: 22- 45

තනතුර - **සංවර්ධන සහකාර (MA3) - තනතුරු 02**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ඕනෑම විෂය ක්ෂේත්‍රයකින් ලබාගත් ප්‍රථම උපාධියක් ලබා තිබීම.

දීමනාව :- කළමනාකරණ සේවා චක්‍ර ලේඛ අංක 01/2025 **MA3**

- රු. 49,831/=
- චක්‍ර ලේඛණ ප්‍රකාරව කොන්ත්‍රාත් තනතුරට අදාල අනෙකුත් දීමනා

වයස් සීමාව : – අවු: 22- 45

තනතුර - **පරිගණක තාක්ෂණ ශිල්පී (MA2-1) - තනතුරු 01**

අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී සිංහල / දෙමළ, ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය ඇතුළුව විෂයයන් හතරකට(04) සම්මාන සහිතව එක් වරකදී විෂයයන් හයකින් (06) සමත් වී තිබීම සහ අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයේ දී සියලුම විෂයන්ගෙන් සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර සමත්ව තෘතීය අධ්‍යාපන පාඨමාලාවක් හැදෑරීම සඳහා අවශ්‍ය සාධන මට්ටම ලබා තිබීම.

තාක්ෂණික නිපුණතා / ප්‍රවීණතා

පරිගණක තාක්ෂණ ශිල්පී තනතුරෙහි කාර්යභාරයට අදාළව තෘතිය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නියම කර ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතා NVQ පහ (5) මට්ටමට අඩු නොවන්නා වූ පරිගණක දෘඩාංග හා මෘදුකාංග තාක්ෂණික පාඨමාලාවක් සාර්ථකව හදාරා සහතික ලබා තිබීම.

විශේෂිත වෙනස් සුදුසුකම්

පරිගණක දෘඩාංග හා මෘදුකාංග තාක්ෂණය පිළිබඳ සහ අන්තර්ජාල සහ වෙබ් භාවිතය පිළිබඳව එක් වසරක පුහුණු පාඨමාලාවක් සාර්ථකව සම්පූර්ණ කර තිබීම සහ රජයේ දෙපාර්තමේන්තුවක/සංස්ථාවක/මණ්ඩලයක හෝ පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ වසර තුනක(03) පළපුරුද්දක් ලබා තිබීම.

දීමනාව :- කළමනාකරණ සේවා චක්‍ර ලේඛ අංක 01/2025 **MA2-1**

- රු. 46,960 /=
- චක්‍ර ලේඛණ ප්‍රකාරව කොන්ත්‍රාත් තනතුරට අදාල අනෙකුත් දීමනා

වයස් සීමාව : – අවු.18-45

තනතුර :-

කළමනාකරණ සහකාර - තාක්ෂණ (MA2-1) – තනතුරු 02

අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී සිංහල / දෙමළ, ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය ඇතුළුව විෂයයන් හතරකට(04) සම්මාන සහිතව එක් වරකදී විෂයයන් හයකින් (06) සමත් වී තිබීම සහ අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයේ දී සියලුම විෂයන්ගෙන් සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර සමත්ව තෘතීය අධ්‍යාපන පාඨමාලාවක් හැදෑරීම සඳහා අවශ්‍ය සාධන මට්ටම ලබා තිබීම.

සමග

තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) විසින් පිළිගත් කාර්මික හෝ වෘත්තීය පුහුණු ආයතනයකින්, අදාළ තනතුරට සම්බන්ධ ක්ෂේත්‍රයක ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 5 වන මට්ටම හෝ ඊට ඉහළ මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

දීමනාව :- කළමනාකරණ සේවා චක්‍ර ලේඛ අංක 01/2025 **MA2-1**

- රු. 46,960 /=
- චක්‍ර ලේඛණ ප්‍රකාරව කොන්ත්‍රාත් තනතුරට අදාල අනෙකුත් දීමනා

වයස් සීමාව : – අවු.18-45

තනතුර :-

කළමනාකරණ සහකාර - (MA1-1) – තනතුරු 07

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී සිංහල / දෙමළ සහ ගණිතය යන විෂයයන් ඇතුළුව විෂයයන් හතර (04) කට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හය (06) කින් සමත්ව තිබීම.

සහ

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයයන් තුනක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

තනතුරට විශේෂිත වෙනත් සුදුසුකම් :-

ඒ ඒ තනතුරෙහි කාර්යභාරයට අදාලව පරිගණක / සරප් / ගිණුම් කටයුතු / ගබඩා කටයුතු / දුරකථන සම්බන්ධීකරණ කටයුතු/ ලිපිකරු කටයුතු ආදී ක්ෂේත්‍රයන් පිළිබඳ දැනුම ලබා තිබීම.

දීමනාව :- කළමනාකරණ සේවා චක්‍ර ලේඛ අංක 01/2025 **MA1-1**

- රු. 43,312 /=
- චක්‍ර ලේඛණ ප්‍රකාරව කොන්ත්‍රාත් තනතුරට අදාල අනෙකුත් දීමනා

වයස් සීමාව : – අවු.18 – 45

තනතුර :- **රියදුරු (PL3) – තනතුරු 02**

අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී යටත් පිරිසෙයින් විෂයයන් දෙකක් සමත් වී තිබීම.

සහ

මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ බර වාහන රියදුරු බලපත්‍රයක් ලබා තිබීම. මෝටර් රථ රියැදුරන් රියැදුරු බලපත්‍රය ලැබීමෙන් පසු අවම වශයෙන් වසර තුන (03) ක පළපුරුද්ද ලබා තිබිය යුතුය.

දීමනාව :- කළමනාකරණ සේවා චක්‍ර ලේඛ අංක 01/2025 **PL3**

- රු. 40,834 /=
- චක්‍ර ලේඛණ ප්‍රකාරව කොන්ත්‍රාත් තනතුරට අදාල අනෙකුත් දීමනා

වයස් සීමාව : – අවු.18 -45

තනතුර :- **චිත්‍රපට ප්‍රතිසංස්කරණ සහායක (PL2) – තනතුරු 02**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයට පෙනී සිට අවම වශයෙන් විෂයයන් දෙකක් (02) සමත් වී තිබීම.

සහ

චිත්‍රපට ප්‍රතිසංස්කරණ සහායක තනතුරට නියමිත කාර්මික නිපුණතාව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරණු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) දෙවන හෝ තුන්වන මට්ටමට සරිලන සේ අත්පත් කර ගෙන තිබීම හෝ ජාතික චිත්‍රපට සංස්ථාව විසින් ලබා දෙනු ලබන අර්ධ කාලීන කාර්මික පුහුණු පාඨමාලා සහතිකයක් ලබා තිබීම සහ චිත්‍රපට ප්‍රතිසංස්කරණ කටයුතු පිළිබඳ වසර 02 ක පළපුරුද්ද.

දීමනාව :- කළමනාකරණ සේවා චක්‍ර ලේඛ අංක 01/2025 **PL2**

- රු. 40,008 /=
- චක්‍ර ලේඛණ ප්‍රකාරව කොන්ත්‍රාත් තනතුරට අදාල අනෙකුත් දීමනා

වයස් සීමාව : – අවු.18 - 45

තනතුරේ ස්වභාවය හා සේවා කොන්දේසි :-

මෙම බඳවාගැනීම් මූලික වශයෙන් වසර 01 ක කාලයක් සඳහා කොන්ත්‍රාත් පදනම මත වේ. එමෙන්ම ලිත් මසක දැනුම් දීමකින් කොන්ත්‍රාත් කාල සීමාව අවසන් කිරීමට පත්වීම් බලධාරියාට හැකියාවක් ඇත. සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තියන්ගේ භාර අරමුදල සඳහා දායක විය යුතුය.

බඳවාගැනීමේ ක්‍රමය :- ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් හෝ ලිඛිත පරීක්ෂණයක් මගින් ඉහළම ලකුණු ලබාගන්නා අය අතරින් පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුසුකම් ලත් අයදුම්කරුවන් තෝරා ගැනේ.

අයදුම්කරුවන් සඳහා කොන්දේසි

- අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය.
- අයදුම්කරුවන් තනතුරේ රාජකාරී හොඳින් ඉටුකිරීමට ශාරීරිකව හා මානසිකව යෝග්‍ය විය යුතු අතර, දිවයිනේ ඕනෑම ප්‍රදේශයක රාජකාරී කිරීමට හැකියාව තිබිය යුතුය. (කෙසේ වෙතත් ඔබගේ නිත්‍ය සේවා ස්ථානය නොවන 303, බෞද්ධාලෝක මාවත, කොළඹ 07 වේ.)
- අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍යය තත්ත්වයෙන් යුක්ත විය යුතුය.
- අයදුම්පත්‍රය සමඟ උප්පැන්න සහතිකයේ/අධ්‍යාපන/වෘත්තීය සහතික සහ සේවා සහතිකවල සහතික කළ පිටපත් අමුණා එවිය යුතුය.
- මෙය කොන්ත්‍රාත් තනතුරකි. තෝරාගත් අපේක්ෂකයින් තම වැටුපෙන් 8% ක් සේවක අර්ථසාධක අමුදල සඳහා දායක විය යුතු අතර, ආයතනය සේවක අර්ථ සාධක අරමුදල සඳහා 12% ක් සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල සඳහා 3% ක් දායක කරනු ඇත.
- මූලික වැටුප සහ කොන්ත්‍රාත් තනතුර සඳහා හිමි අනෙකුත් අනුමත දීමනා ආයතනය විසින් ගෙවනු ලැබේ.
- රජයේ /රාජ්‍ය සංස්ථා /මණ්ඩල/ ව්‍යවස්ථාපිත ආයතනවල සේවය කරන්නෙකු නම් අදාළ ආයතන ප්‍රධානීගේ නිර්දේශ සහිතව අයදුම්පත ඉදිරිපත් කළ යුතුය.

නියමිත සුදුසුකම් සම්පූර්ණ නොකරන ලද අසම්පූර්ණ සහ නියමිත දිනෙන් පසුව යොමු කරනු ලබන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ඉහත සඳහන් පුරප්පාඩු සම්බන්ධයෙන් බඳවා ගැනීමේ ක්‍රියාවලිය සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන් කල් දැමීම, අත්හිටුවීම, සංශෝධනය කිරීම, සීමා කිරීම හෝ අවලංගු කිරීම, ප්‍රකාශයට පත් කර ඇති තනතුරු අතරින් කිහිපයකට පමණක් බඳවා ගැනීම් සිදු කිරීම හෝ ඒ සම්බන්ධයෙන් අවශ්‍ය යැයි සැලකෙන වෙනත් ඕනෑම තීරණයක් ගැනීමේ පූර්ණ බලය ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ.

සභාපති
ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
303, බෞද්ධාලෝක මාවත
කොළඹ 07